ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලයට අනුබද්ධිත ශ්‍රී ලංකා සංස්කෘතික අධ්‍යාපන කේන්ද්‍රය, ඩුබායි.
Sri Lanka Cultural Education Centre attached to the Consulate General of Sri Lanka, Dubai
බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි අංක E/A.D./ද.ප./ලි/001

2018 මැයි 21 යොමු අංකය: 1718-043

දයාබර දෙමව්පියන් වෙත,

**2017-2018 අධ්‍යයන වසරේ අවසානය නව අධ්‍යයන වසරේ ආරම්භය**

අප, අපගේ පවතින අධ්‍යයන වසරේ අවසානයට ලඟාවී ඇති බවත් 2018 සැප්තැම්බර් මස නව අධ්‍යයන වසර ආරම්භ වන බවත් ඔබ සියලු දෙනා දන්නා කරුණකි.

වසර අවසානය සහ නව වසරේ ආරම්භය පිලිබඳ වැදගත් කරුණු ඔබ සැමගේ දැනගැනීම පිණිස පහත සඳහන් කරමු:

1. පවතින 2017-2018 අධ්‍යයන වසරේ අවසාන පාසල් දිනය **2018 මැයි මස 25 වැනිදා,** සිකුරාදා වන්නේය.
2. දැනට දහම් පාසලේ අධ්‍යාපනය ලබන දරුවන් හට 2018-2019 නව අධ්‍යයන වසර ආරම්භය **2018 සැප්තැම්බර් 14 වැනිදා,** සිකුරාදා වනු ඇත. එදින, දහම් පාසලේ දැනට ඉගෙන ගන්නා පන්තියට සහභාගී විය යුතුය.
3. පසුගිය වසරේ පාඩම් නැවත මතක්කර දීම **2018 සැප්තැම්බර් 14 සහ 21 සිකුරාදා දිනයන්හිදී** සිදුකෙරෙනු ඇත.
4. නව අධ්‍යයන වසර සඳහා නවක සිසු සිසුවියන් බඳවා ගැනීම 2018 සැප්තැම්බර් මස 14, 21 සහ 28 දිනයන්හිදී දහම් පාසල් පරිශ්‍රයේදී සිදුකෙරෙනු ඇත. 1 වන ශ්‍රේණියේ නවක දරුවන් සඳහා අධ්‍යාපන කටයුතු ආරම්භ කරනුයේ ඔක්තෝබර් 5 වැනිදා, සිකුරාදා ය.
5. සියලුම පන්තිවල **සිංහල, බුද්ධාගම සහ අපේ උරුමය විෂයයන්** සඳහා ඇගයීමේ පරීක්ෂණය පැවැත්වීම අදාළ විෂයයන් පැවැත්වෙන කාල සීමාව ඇතුලතදී **2018 සැප්තැම්බර් 28** වන සිකුරාදා සිදුකෙරෙනු ඇත.

   **<u>සැ. යු.: මෙම ඇගයීමේ පරීක්ෂණ නැවත නොපැවැත්වෙන බව කරුණාවෙන් අවධාරණය කර සිටිමු.</u>** පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව දරුවා සුදුසු පන්තියකට අනුගත කරන අතර දරුවාගේ ඉදිරි අධ්‍යාපන කටයුතු එම පන්තියේදී කරගෙන යෑම අනිවාර්ය වනු ඇත. එබැවින් නිවාඩු කාලය තුල පසුගිය වසරේ ඉගෙනගත් පාඩම් හොඳින් මතක්කර දී දරුවන් පරීක්ෂණයට සූදානම් කරවීම ඔබගේ වගකීම වනු ඇත. පරීක්ෂණයට සහභාගී නොවන දරුවන් නව අධ්‍යයන වසරේදී දැනට අධ්‍යාපනය ලබන පන්තියේම අධ්‍යාපන කටයුතු කරගෙන යා යුතුය.
6. මෙම පරීක්ෂණ වලින් පහසුවෙන් සමත් වීම සඳහා, පහළ පන්ති වල දරුවන් හට නිවාඩු කාලය තුල නිවසේදී ලබාදිය හැකි පාඩම්, දහම් පාසලේ අවසාන දිනයේදී, **2018 මැයි 25 වැනිදා** දහම් පාසලේදී ලබා දෙනු ඇත.
7. දහම් පාසලට ඔබගේ දරුවා ඇතුලත් කිරීමේදී ඔබ පිළිපදින බවට සහතික කල කොන්දේසි මාලාවේ කොන්දේසි අංක 6 සහ 7 (උපුටා ගැනීමක් පහත දක්වා ඇත) අනුව දහම් පාසල පැවැත්වූ දින ප්‍රමාණයෙන් 70% කට වැඩියෙන් සහභාගී නොවූ සහ දහම් පාසලට දැනුම් දීමකින් තොරව නොකඩවා දින තුනක් පාසලට නොපැමිණි දරු දැරියන් හට නව අධ්‍යයන වසරේ ඇගයීමේ පරීක්ෂණයට ඉදිරිපත් විය නොහැකි බව අවධාරණය කරමු.

   මෙම කොන්දේසි කඩකළ දරු දැරියන්ගේ දෙමාපියන් හට ඒ බව දන්වා විද්‍යුත් තැපැල email පණිවිඩ එවනු ඇත. එම දෙමාපියන් හට ඒ සම්බන්ධව සංවිධායක කමිටුව සමග සාකච්චා කිරීමට අවශ්‍ය නම් කරුණාකර දහම් පාසලේ විද්‍යුත් තැපැල (email) මගින් දන්වා එවිය හැක.
8. දහම් පාසලට දරු දැරියන් කැඳවාගෙන ඒම සහ යාම සඳහා පැමිණෙන වාහන නැවැත්වීම පිළිබඳව පනවා ඇති කොන්දේසි කඩ කල දෙමාපියන්, එම කොන්දේසි කඩකිරීම පිළිබඳව දන්වා එවා ඇති දැන්වීම අනුව දහම්පාසලේ සංවිධායක කමිටුව හමුවීමට නොපැමිනුන දෙමාපියන්ගේ දරුවන් හටද මෙම ඇගයීමේ පරීක්ෂණයට පෙනී සිටීමට අවස්ථාව ලැබෙනුයේ සංවිධායක කමිටුව හමුවීමෙන් පසුව පමණක් බව දන්වා සිටිමු.

   එම දෙමාපියන්ට සංවිධායක කමිටුව හමුවීම සඳහා සැප්තැම්බර මස 14 සහ 21 දින උදෑසන 9.00-10.00 අතර වෙලාවක්, email පණිවිඩයක් එවීමෙන් වෙන්කර ගත හැක.

**දහම් පාසලට ඔබගේ දරුවා ඇතුලත් කිරීමේදී ඔබ පිළිපදින බවට සහතික කල කොන්දේසි මාලාවේ උපුටා ගැනීමක්:**

6.0 අධ්‍යාපන කටයුතු සාර්ථකව කරගෙන යෑම සඳහා දරුවන් දිනපතා පාසලට පැමිණීම අත්‍යාවශ්‍ය වනු ඇත. අධ්‍යයන වසර ඇතුළත දහම් පාසල පැවැත්වෙන දින ප්‍රමාණයෙන් 70% කට වැඩියෙන් සහභාගී වන දරු දැරියන් හට පමණක් වර්ෂ අවසාන පරීක්ෂණයට ඉදිරිපත් විය හැකි බවත්, ඒ අනුව ඉහළ පන්තියට අනුගත කිරීම සිදු කෙරෙන බවද කරුණාවෙන් සලකන්න.

7.0 දැනුම් දීමකින් තොරව නොකඩවා දින තුනක් (3) පාසලට නොපැමිණෙන දරුවන් පාසල හැර ගියාසේ සලකනු ඇත. එම දරුවන් නැවත පාසලට ඇතුළත් කරවීමට අවශ්‍ය නම් මීළඟ පාසල් වාරයේදී අලුත් ඉල්ලුම් පතක් ඉදිරිපත් කළ යුතුය.

**ස්තුතියි,**

**සංවිධායක මණ්ඩලය**